ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදනය අංක: HRC/P/i/S/15/07/26

## මාධ්‍ය නිවේදනය

### කොමිෂන් සභාවේ නිලධාරීන් හට වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණය සඳහා ඉඩ නොලැබීම සහ ඊට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාව

2026 ජූලි 7 වන දින රාත්‍රියේ කොමිෂන් සභාවේ නිලධාරීන් හට වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණයට අවස්ථාව නොදීම හා ඊට අදාළ අනෙකුත් කරුණු සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2026 ජූලි 14 වන දින වැලිකඩ බන්ධනාගාර අධිකාරීවරයා සහ ප්‍රධාන ජේලර්වරයා ඇතුළු වැලිකඩ බන්ධනාගාරයට අනුයුක්ත නිලධාරීන් කිහිප දෙනෙකු කොමිෂන් සභාව හමුවට කැඳවීය. කොමිෂන් සභාවේ සභාපති, විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සාකච්ඡාවට කොමසාරිස්වරුන්, පරීක්ෂණ සහ විමර්ශන අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ජූලි 7 වන දින වැලිකඩ බන්ධනාගාරය වෙත සංචාරය කළ කොමිෂන් සභාවේ මානව හිමිකම් නිලධාරීන් දෙදෙනා ද සහභාගී වූහ.

මෙම සාකච්ඡාවේදී, කොමිෂන් සභාව 2026 ජූලි 8 දිනැතිව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රාජකාරි ආවරණය කරන) වෙත යවන ලද ලිපියෙන් ප්‍රකාශ කරන ලද කොමිෂන් සභාවේ දැඩි කනස්සල්ල නැවත අවධාරණය කළ අතර, ජූලි 7 වන දින කොමිෂන් සභා නිලධාරීන් හට වැලිකඩ බන්ධනාගාරය තුළට ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත බරපතල හා නිදහසට හේතු නොමැති උල්ලංඝනය කිරීමක් බව අවධාරණය කරන ලදී. කොමිෂන් සභා පනත මගින් පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම වේලාවක ඕනෑම රැඳවුම් ස්ථානයකට ඇතුළු වීමට කොමිෂන් සභාව වෙත පැහැදිලිවම බලය පැවරී ඇත. වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ අයුතු සැලකිලි පිළිබඳව චෝදනා පිළිබඳ තොරතුරු ලැබී ඇති විට, බන්ධනාගාර වල සුභසාධනය පිළිබඳව අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට කොමිෂන් සභාවට ඇති අධිකාරි බලය එම ක්‍රියාව මඟින් දැඩි ලෙස අවතක්සේරු කිරීමක් කර ඇත. ජූලි 7 වන දින තීරණාත්මක අවස්ථාවක ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම මඟින් චෝදනා පිළිබඳව ඵලදායී ලෙස හා අවශ්‍ය කාලරාමුව තුළ විමර්ශනය කිරීමේ අවස්ථාව අහිමි වී ඇත.

ජූලි 7 වන දින රාත්‍රී 9.15ට පමණ සිදු කළ එම නිරීක්ෂණ සංචාරයේදී, කොමිෂන් සභා නිලධාරීන්ගේ ආරක්ෂාව සහතික කළ නොහැකි තත්ත්වයක් වැලිකඩ බන්ධනාගාරය තුළ උද්ගතව තිබූ බව බන්ධනාගාර නිලධාරීහු පැහැදිලි කළහ. එම අවස්ථාවේ බන්ධනාගාර නිලධාරීන් හය දෙනෙකු පමණ රාජකාරියේ යෙදී සිටි බවත්, බන්ධනාගාරය තුළ රැඳවියන් අතර ඇතිවී තිබූ නොසන්සුන් තත්ත්වයක් සමඟ ඔවුන් කටයුතු කරමින් සිටීමට සිදුවූ බවත් නිලධාරීන් ප්‍රකාශ කරන ලදී. මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ප්‍රචණ්ඩක්‍රියා අතරතුර බන්ධනාගාර නිලධාරීන් ඝාතනය කිරීමට පළිගැනීමක් ලෙස මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන්ට පහර දීමට බන්ධනාගාර නිලධාරීන් පිරිසක් සැලසුම් කර ඇති බවට නිලධාරීන්ට තොරතුරු ලැබී තිබූ බව ද ප්‍රකාශ විය. බන්ධනාගාර

නිලධාරීන් අතර 'භේදයක්' පැවති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස වැලිකඩ බන්ධනාගාරයේ තත්ත්වය අතිශය නොසන්සුන් සහගතව පැවති බවත් ගම්‍ය විය. කෙසේ වෙතත්, බන්ධනාගාරය වෙත පැමිණි කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත මෙම කරුණු පැහැදිලිව දැනුම් දී නොතිබූ බව ඔවුන් පිළිගන්නා ලදී. සන්නිවේදන දුර්වලතාවය පිළිබඳව එම නිලධාරීන් කනගාටුව පළ කළ අතර, අනාගතයේදී මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට වගබලා ගැනීමට පොරොන්දු වූහ.

වැලිකඩ බන්ධනාගාර නිලධාරීන්ගේ එම අවස්ථාවේ ගනු ලැබූ තීරණ සහ හැසිරීම කොමිෂන් සභාවේ පැවරී ඇති බලයට අගෞරව සහගත බව කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය. එම නිලධාරීන් විසින් සපයන ලද පැහැදිලි කිරීම පිළිබඳව සෑහීමකට පත් නොවන බවත්, කුමන තත්ත්වයක් යටතේ වුවද, බන්ධනාගාර පරිශ්‍රය තුළ ආරක්ෂාව දුර්වල වී ඇති බව පිළිබඳව දැනුම් දීමට අපොහොසත් වීම පිළිගත නොහැකි බවත් කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය.

කොමිෂන් සභාව වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් සමඟ තවත් කරුණු කිහිපයක් සාකච්ඡා කරන ලදී. පසුදින බන්ධනාගාරයට කළ සංචාරවලදී, මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන් කිහිප දෙනෙකු ඔවුන්ට වධහිංසා පැමිණවීම සහ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම ප්‍රතික්ෂේප කිරීම වැනි වෙනත් ආකාරයේ අයුතු සැලකිලි ඇතුළු පළිගැනීම්වලට ලක්ව ඇති බවට කොමිෂන් සභා නිලධාරීන්ට පැමිණිලි කර ඇත. සමහර සිරකරුවන් තුවාල ලබා සිටින බවත්, ඒ සඳහා ඔවුන්ට එම අවස්ථාව වන විටත් වෛද්‍ය ප්‍රතිකාර ලැබී නොතිබූ බවත් නිරීක්ෂණය වූ බව කොමිෂන් සභාවේ නිලධාරීහු වාර්තා කළහ. බන්ධනාගාර අනෙකුත් රැඳවියන්ගෙන් වෙන් වූ විට පහරදීමට ලක් වේ යැයි බියෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට මැලිකමක් දක්වන බව සමහර රැඳවියන් ප්‍රකාශ කර ඇත.

මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන් සිටින ස්ථානය ඔවුන්ගේ ළඟම ඥාතීන්ට දැනගැනීම සහතික කිරීම සඳහා ඔවුන් යොමු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් සම්බන්ධයෙන් ද කොමිෂන් සභාව කනස්සල්ල පළ කළේය. 2018 අංක 5 දරන බලහත්කාර අතුරුදහන් කිරීම් වලින් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත යටතේ, රඳවා තබා ඇති ඕනෑම පුද්ගලයෙකු සිටින ස්ථානය හෙළි කිරීමට දීර්ඝ කාලයක් තිස්සේ අපොහොසත් වීම නඩු පැවරිය හැකි වරදක් විය හැකි බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. තවද, මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද ඇතැම් රැඳවියන් ඔවුන්ගේ සිර දඬුවම් කාලය අවසන් වීමෙන් පසු නිදහස් කිරීමට නියමිතව සිටි නමුත් තවමත් නිදහස් කර නොමැති බවට කොමිෂන් සභාව වෙත තොරතුරු ලැබී තිබුණි. එවැනි සිරකරුවන් දිගටම රඳවා තබා ගැනීම නීතිවිරෝධී වන බවද කොමිෂන් සභාව වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ අයුතු සැලකිලි මෙන්ම අත්අඩංගුවේ සිටියදී සිදු වූ මරණ සම්බන්ධයෙන් මීගමුව බන්ධනාගාරයේ හා පසුව ඇතිවූ අනෙකුත් බන්ධනාගාරවල සිදුවීම් ගැනද විමර්ශනය තවදුරටත් සිදුකරගෙන යන බව කොමිෂන් සභාව ප්‍රකාශ කළ අතර, දැනට පැවැත්වෙන විමර්ශනයට උපරිම සහයෝගය ලබා දෙන ලෙස ද වැලිකඩ බන්ධනාගාර නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. කොමිසම වැලිකඩ බන්ධනාගාර නිලධාරීන්ට පහත සඳහන් නිර්දේශ නිකුත් කරන අතර, මෙම නිර්දේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහතික කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රාජකාරි ආවරණය කරන) වෙතින් ඉල්ලා සිටී:

1. **ඕනෑම අවස්ථාවක සහ පූර්ව දැනුම්දීමකින් තොරව රැඳවුම් ස්ථානවලට ඇතුළු වී පරීක්ෂා කිරීමට කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිත බලය ඇති බව බන්ධනාගාර නිලධාරීන් දැනුවත් කිරීම සඳහා චක්‍රලේඛයක් මගින් කඩිනම් පියවර ගැනීම.**

2. **මීගමුව බන්ධනාගාරයෙන් මාරු කරන ලද රැඳවියන්ට එරෙහිව කිසිඳු ආකාරයක පළිගැනීම්වලින් (වධහිංසා පැමිණවීම සහ අත්‍යවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතික්ෂේප කිරීම ඇතුළුව වෙනත්**

**ආකාරයේ අයුතු සැලකිලි ආදිය) වැළකී සිටීමට සියලුම බන්ධනාගාර නිලධාරීන්ට නියෝග නිකුත් කිරීම හා එවැනි නියෝග වලට අනුකූල වන බවට දැඩි ලෙස නිරීක්ෂණය කිරීම, පළිගැනීමේ ක්‍රියාවන්හි යෙදෙන ඕනෑම නිලධාරියෙකුට එරෙහිව කඩිනම් විනය ක්‍රියාමාර්ග ගැනීම සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොමිෂන් සභාවට සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට එවැනි ඕනෑම සිදුවීමක් වාර්තා කිරීම.**

3. **මීගමුව බන්ධනාගාරයේ සිට මාරු කරන ලද සියලුම රැඳවියන් සිටින ස්ථාන ඔවුන්ගේ ළඟම ඥාතීන්ට අනාවරණය කිරීමට කඩිනම් පියවර ගැනීම.**

4. **සිර දඬුවම් කාලය සම්පූර්ණ කර ඇති සිරකරුවන් ප්‍රමාදයකින් තොරව නිදහස් කිරීම තහවුරු කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.**

නිහාල් චන්ද්‍රසිරි

මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ අංශය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

15.07.2026

දුරකථන අංකය : 011 2505595

විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com